සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2021.02.22

සියළුම,
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන්,
සමෘද්ධි සංවර්ධන නිලධාරීන්,
සමෘද්ධි ප්‍රජාමූල හා ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සභාපතිවරුන්.

**සමෘද්ධි චක්‍රලේඛ :- ප්‍රජාමූල/11/2020/02**

**එකතු කිරීම -01/2021**

**<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන විසින් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන "සමෘද්ධි අරුණළු සහන" ණය වැඩසටහන</u>**

## 1. හැඳින්වීම.

1.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හරහා එහි සාමාජික / සාමාජිකාවන්ට (සමෘද්ධි ප්‍රතිලාභීන්ට) ක්‍රියාත්මක කරනු ලබන "සමෘද්ධි අරුණළු සහන" ණය වැඩසටහනට අදාළව 2020 මාර්තු 16 දින නිකුත් කරන ලද ඉහත අංක සඳහන් චක්‍රලේඛයට "පළමු එකතුව" ලෙසින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ඇත.

1.2 ශ්‍රී ලංකා රජයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තියට අනුව, ග්‍රාමීය ජනතාව මුහුණ දෙන ක්ෂුද්‍ර ණය (Micro Credit) අර්බුදයට විසඳුමක් ලබා දීම වෙනුවෙන් හඳුන්වා දෙන ලද "අරුණළු සහන" ණය වැඩසටහනට 2021 වර්ෂය තුළදී ප්‍රමුඛතාවය ලබා දෙමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන උපදෙස් හා මඟපෙන්වීම මෙම චක්‍රලේඛ එකතුව මඟින් ලබා දෙනු ඇත.



1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 288 |

**2.** ණය නිකුත් කිරීමට අදාළ සංශෝධිත මූලික කරුණු

2.1 දිවයිනේ සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි සමෘද්ධි බැංකු පාලක මණ්ඩලය විසින් තෝරාගත් එක් ප්‍රජාමූල සංවිධානයක් වෙත එහි සාමාජික ණය ඉල්ලුම පදනම් කරගෙන රුපියල් 300,000/- (ලක්ෂ 03කට) නොවැඩි මුදලක් "ප්‍රතිමූල්‍ය අයිරා ණයක්" ලෙස නිකුත් කිරීම.

2.2 ඉහත 2.1 පරිදි ප්‍රතිමූල්‍ය අයිරා ණය නිකුත් කිරීමට තෝරාගත් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින්, ලැබී ඇති අයදුම්පත් සැලකිල්ලට ගෙන, මහ සභාවේ අනුමැතිය හෝ ආවර්ණ අනුමැතියට යටත්ව විධායක සභාවේ අනුමැතිය මත සාමාජික / සාමාජිකාවන් වෙත රුපියල් 10,000/- (දස දහසක්) නොවැඩි මුදලක් ණය ලෙස නිකුත් කිරීම.

2.3 සමෘද්ධි බැංකුව විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය වෙත නිකුත් කරනු ලබන ණය මුදල සඳහා එම සංවිධානය විසින් ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර තිබීම පමණක් සැලකිල්ලට ගත යුතුවේ.

2.4 ඉහත 2.1 පරිදි සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය වෙත නිතුක් කරනු ලබන ප්‍රතිමූල්‍ය අයිරා ණය සඳහා නියමිත ණය සංරක්ෂණ වාරිකය 0.5% ක් සමෘද්ධි බැංකුව විසින් හා 0.5%ක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් දැරිය යුතුවේ.

2.5 සමෘද්ධි අරුණළු සහන ණය ලබා ගත් සාමාජිකයෙකුට ස්වභාවික හේතූන් මත ණය ගෙවීමට නොහැකි වුවහොත් සමෘද්ධි බැංකු මෙහෙයුම් උපදෙස් අනුව සමෘද්ධි බැංකු සමිතියෙන් ණය සංරක්ෂණ වන්දියක් ලබා ගත හැකි අතර එම වන්දිය පදනම් කරගෙන ණය පියවීමට කටයුතු කළ යුතුවේ.

2.6 සමෘද්ධි බැංකු විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වෙත නිකුත් කරනු ලබන ප්‍රතිමූල්‍ය අයිරා ණය සඳහා හීනවන ශේෂය පදනම් කරගෙන සියයට හතක (7%) වාර්ෂික පොලියක් අයකරනු ඇත.

2.7 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් සමෘද්ධි බැංකුවෙන් ලබාගන්නා ප්‍රතිමූල්‍ය අයිරා ණය වලට අදාළව මාසිකව නියමිත පොලිය ගෙවිය යුතු අතර සාමාජිකයන් විසින් ආපසු ගෙවන ලබන ණය මුදල පදනම් කරගෙන චක්‍රීය ලෙස ඉල්ලුම් කරනු ලබන අනෙකුත් සාමාජිකයන් වෙත ණය ලබා දීමට කටයුතු කළ යුතුවේ.

2.8 සාමාජිකයන් විසින් ලබා ගත් අරුණළු සහන ණය ආපසු ගෙවීම මත එකතු වන මුදල් වෙනත් සාමාජිකයෙකු වෙත ණය ලෙස නිකුත් කිරීම සඳහා භාවිතා කළ නොහැකි වන්නේ නම් එසේ එකතුවන මුදල් සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් ප්‍රතිමූල්‍ය අයිරා ණය සඳහා ආපසු ගෙවීමට කටයුතු කළ යුතුවේ.

2.9 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් එහි සාමාජික/ සාමාජිකාවන්ට ලබා දෙන " අරුණළු සහන ණය" සඳහා,

2.9.1 දෛනිකව හෝ සතිපතා ණය ආපසු ගෙවීමේදී මාසිකව සියයට එකක (1%) ස්ථාවර පොලියක්ද

2.9.2 මාසිකව ආපසු ගෙවීමේදී වාර්ෂිකව සියයට දොළහක (12%) හීනවන ශේෂය මත පොලියක්ද අය කළ යුතුවේ.

2.10 සමෘද්ධි බැංකුවෙන් ණය ලබාගෙන හිතාමතා පැහැර හරින ලද බොල්ණයකරුවෙකුට " සමෘද්ධි අරුණළු සහන" ණය නිකුත් නොකළ යුතු අතර බොල්ණය කරුවෙකුගේ ඇප කරුවෙකුට ණය නිකුත් කිරිම මහ සභාවේ අනුමැතිය හෝ ආවර්ණ අනුමැතියට යටතේ විධායක සභාවේ අනුමැතිය මත තීරණය කළ යුතුවේ. බොල්ණයකරුවෙකු වුවද, සමෘද්ධි බැංකුවෙන් ලබාගත් ණය වලට අදාළ නියමිත වාරික ගෙවා අවසන් වූ පසු සමෘද්ධි අරුණළු සහන ණය ලබා ගැනිමට සුදුස්සෙකු වනු ඇත.

2.11 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයට "අරුණළු සහන ණය" ක්‍රමවේදය තුළින් වාර්ශිකව සියයට පහකට (5%) වැඩි ආන්තික ණය පොලි ආදායමක් හිමිවනු ඇත. එම පොලි ආදායම පදනම් කරගෙන සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ගණුදෙනු සටහන් කිරිමේ කාර්යය සඳහා මහ සභා අනුමැතිය මත තෝරාගත් ප්‍රජා නායකයෙකු, සාමාජිකයෙකු හෝ සාමාජිකයෙකුගේ දරුවෙකු වෙත මහා සභාව විසින් තීරණය කරන මාසික දිමනාවක් ගෙවිමට අවසර දෙනු ලැබේ.

2.12 සාමාජික අවශ්‍යතාවය පරිදි "සමෘද්ධි අරුණළු සහන ණය" නිකුත් කිරිමට අදාළ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ මහ සභා අනුමැතිය මත සුදුසු ස්ථානයක් තෝරාගත යුතු අතර එය සියළු සාමාජිකයින්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ප්‍රජා නායකයෙකුගේ හෝ සාමාජිකයෙකුගේ නිවසක් විම වඩාත් සුදුසු වේ.

**3. සමෘද්ධි අරුණළු සහන ණය නිකුත් කිරිමට අදාළ ගණුදෙනු සටහන් කිරිමේ ක්‍රමවේදය**

3.1 සමෘද්ධි බැංකුව විසින් ලබා දෙන නිවේදන ලිපියට අනුව ප්‍රජාමූල සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමට තැන්පත් කරනු ලබන "සමෘද්ධි අරුණළු ප්‍රතිමූල්‍ය අයිරා ණය මුදල",

| | |
|---|---|
| බැංකු පොත | - තැන්පත් තිරුව |
| සමෘද්ධි බැංකුවට ගෙවිය යුතු අරුණළු ප්‍රතිමූල්‍ය අයිරා ණය පිටුව (වගකිම්) | - II තිරුව |

3.2 සාමාජිකයින්ට ණය ලබා දිම සඳහා ප්‍රජාමූල සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමෙන් මුදල් ආපසු ගැනිම.

| | |
|---|---|
| බැංකු පොත, | - ආපසු තිරුව |
| මුදල් පොත | - ලැබිම් තිරුව |

3.3 ණය ලබා ගැනිමට බලාපොරොත්තුවන සාමාජිකයින් මාසික මහ සභා රැස්විමකදි ඉල්ලිමක් කර ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගෙන තිබිය යුතු අතර පවතින සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වය යටතේ මහ සභාව රැස්කළ නොහැකි අවස්ථාවලදි, මහ සභාවේ ආවර්ණ අනුමැතියට යටත්ව විධායක සභාවේ පූර්ව අනුමැතිය ලබා ගෙන තිබිය යුතුවේ.

3.4 ඉහත 3.3 අනුව අනුමැතිය ලබා ගත් සාමාජිකයින් සමෘද්ධි චක්‍රලේඛ අංක " ප්‍රජාමූල /11/2020/02" හි ඇමුණුම පරිදි අයදුම්පත්‍රයක් ප්‍රජාමූල සංවිධානයේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතු අතර ලැබෙන සියළු අයදුම්පත්හි විස්තර සි.ආර් පොතක ලේඛන ගත කළ යුතුවේ.

3.5 ඉහත 3.4 අනුව ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ හා මුදල් වුවචරයකට අත්සන් ලබාගෙන ණය මුදල අදාළ සාමාජිකයාට නිකුත් කළ යුතු අතර පහත සඳහන් පරිදි පොත්වල සටහන් කළ යුතුවේ. එකවර ණය කිහිපයක් නිකුත් කරන විටක සකස් කරන ලද වවුචර් කිහිපය එකට අමුණා සකස් කරන ලද එක් වුවචරයක් මගින් එකතු අගය සටහන් තැබිය හැකිවේ.

මුදල් පොත - ගෙවීම් තීරුව

සාමාජිකයන්ගෙන් ලැබිය යුතු අරුණළු සහන ණය පිටුව (වත්කම්) - I තීරුව

3.6 ඉහත 3.5 පරිදි සටහන් තබන විටම " අරුණළු සහන ණය පොත" නමින් වෙනම සි.ආර්. පොතක, එක් එක් ණයකරු වෙනුවෙන් පිටුවක් ආරම්භ කර එහි පහත ආකෘතියට අනුව සටහන් තැබිය යුතුය.

**අරුණළු සහන ණය පොත ( වත්කම් )**

**පිටු අංක.......... - .....නම...................** ගොනු අංකය :-අරුණළු/.....

| දිනය | මුලාශ්‍ර ලේඛනය | විස්තරය | යොමුව | ණය වීම | අයවීම | | ශේෂය (රු) | සාමාජික අත්සන |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | පොළිය | මුදල | | |
| ............. | CV - ..... | නිකුත් කිරීම | මුදල් | ........... | | | .......... | xx |
| ............. | R – ....... | වාරික ලැබීම | මුදල් | | ........... | ....... | .......... | xx |

3.7 ඉහත 3.5 පරිදි සටහන් තබන විටම ණය නිකුත් කළ සාමාජිකයා වෙත පහත සඳහන් ආකෘතිය පරිදි සකස් කරන ලද " සාමාජික ණය කාඩ්පත" ක් ලබා දීම හෝ සාමාජිකයා විසින් රැගෙන එනු ලබන අභ්‍යාස පොතක සටහන් තැබීමට හැකිවේ.

**සාමාජික ණය කාඩ්පත**

**නම** - ..............................

**සාමාජික අංකය** - ..............................

**ණය අංකය** - ..............................

**වර්ෂය** - ..................................

| මාසය හා දිනය | ණය වර්ගය | ණය වීම | ණය ගෙවීම | | ශේෂය (රු) | භාණ්ඩාගාරික අත්සන |
|---|---|---|---|---|---|---|
| | | | පොළිය | මුදල | | |
| ................. | අරුණළු | ................ | | | ........... | xx |
| .................. | | | .......... | ............ | ........... | xx |

3.8 දෛනිකව,සතිපතා හෝ මාසිකව ණය ආපසු ගෙවීමේදී අදාළ සාමාජිකයා වෙත ණය මුදල හා පොලිය වෙන්වෙන්ව සදහන් කරමින් ලදුපතක් නිකුත් කළ යුතු අතර එම ලදුපත පදනම් කරගනිමින් පහත සදහන් පරිදි පොත්වල සටහන් තැබිය යුතුය. එකවර ණය කිහිපයක් සදහා වාරික මුදල් හා පොලිය ලැබීමේදී නිකුත් කරන ලදුපත්වල විස්තර ඇතුළත් ලේඛණයක් සකස් කර එහි එකතු අගය සටහන් තැබිය හැකිවේ.

| | |
|---|---|
| මුදල් පොත | - ලැබීම් තිරුව |
| සාමාජිකයන්ගෙන් ලැබිය යුතු අරුණළු සහන ණය පිටුව (වත්කම්) | - II තිරුව |
| සාමාජිකයන්ගෙන් අය කර ගන්නා ලද ණය පොලි පිටුව ( ආදායම) | - II තිරුව |

3.9 ඉහත 3.8 පරිදි පොළිය සමග ණය ආපසු ගෙවීමේදී, පොත්වල සටහන් තබන විටම ඉහත 3.6 පරිදි "අරුණළු සහන ණය පොතේ" ද, 3.7 පරිදි සාමාජික ණය කාඩ්පතේද සටහන් තැබිය යුතුය.

3.10 සෑම මාසයක් අවසානයේදිම ඉහත 3.6 පරිදි සකස් කරන ලද " අරුණළු සහන ණය පොතේ" එක් එක් පිටුවේ අවසාන ශේෂයන්ගේ ලැයිස්තුවක් වෙනම ගෙන එහි එකතුව ගණුදෙනු සාරාංශ පොතේ "සාමාජිකයන්ගෙන් ලැබිය යුතු අරුණළු සහන ණය" පිටුවේ ශේෂයට සමාන වන බවට තහවුරු කර ගත යුතුවේ.

3.11 සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් " අරුණළු ප්‍රතිමුලා අයිරා ණය" මුදල සදහා බැංකුව විසින් අයකර ගනු ලබන ණය සංරක්ෂණ මුදල (0.5%) පහත පරිදි සටහන් තැබිය යුතුවේ.

| | |
|---|---|
| බැංකු පොත | - ආපසු තිරුව |
| ණය සංරක්ෂණ ගාස්තු පිටුව (වියදම්) | - I තිරුව |

3.12 සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් අරුණළු ප්‍රතිමුලා අයිරා ණය ආපසු ගෙවීමේදී, එම මුදල ප්‍රජාමුල සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමට තැන්පත් කර විධායක සභා අනුමැතිය මත ගරු සභාපති විසින් අදාළ ණය මුදල් ආපසු අය කර ගන්නා ලෙස ලිඛිතව බැංකුව වෙත දැනුම් දිය යුතු අතර පහත පරිදි එය සටහන් තැබිය යුතුවේ.

| | |
|---|---|
| බැංකු පොත | - ආපසු තිරුව |
| සමෘද්ධි බැංකුවට ගෙවිය යුතු අරුණළු ප්‍රතිමුලා අයිරා ණය පිටුව (වගකීම්) | - I තිරුව |

3.13 සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් අරුණළු ප්‍රතිමුලා අයිරා ණය සදහා ප්‍රජාමුල සංවිධානය විසින් ගෙවිය යුතු මාසික පොළිය ඉතිරි කිරිමේ ගිණුමෙන් අය කර ගන්නා ලෙස විධායක සභා අනුමැතිය මත ගරු සභාපති විසින් " ස්ථාවර නියෝගයක්" ලිඛිතව සමෘද්ධි බැංකු වෙත ලබා දි තිබිය යුතු අතර ගෙවන ලද එම පොළිය පහත පරිදි සටහන් තැබිය යුතුය.

| | |
|---|---|
| බැංකු පොත | - ආපසු තිරුව |
| සමෘද්ධි බැංකුවට ගෙවන ලද ණය පොළි පිටුව (වියදම්) | - I තිරුව |

3.14 ස්වභාවික ආපදාවක් මත යම් සාමාජිකයෙකුට / සාමාජිකාවකට ණය ආපසු ගෙවීමට නොහැකි වුවහොත් මහ සභාවේ අනුමැතිය හෝ මහ සභාවේ ආවර්ණ අනුමැතියට යටත්ව විධායක සභාවේ අනුමැතිය මත එම සාමාජිකයා පිළිබඳ විස්තර ඇතුළත් ලිපියක් මගින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ගරු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරිකගේ අත්සනින් සමෘද්ධි බැංකුව වෙත ණය සංරක්ෂණ වන්දිය මගින් ණය මුදල අය කර ගන්නා ලෙස ඉල්ලීමක් කළ යුතුවේ.

3.15 ඉහත 3.14 පරිදි සමෘද්ධි බැංකුව වෙත ලද ඉල්ලීමට අනුව සමෘද්ධි බැංකුව විසින් සමෘද්ධි බැංකු සමිතියෙන් අදාළ වන්දි මුදල ලබා ගැනීමටත් ඒ අනුව ප්‍රජාමූල සංවිධානය වෙත නිකුත් ණය ප්‍රතිමූල්‍ය අයිරා ණය මුදලින් අඩු කිරීමටත් කටයුතු කළ යුතුවේ.

3.16 ණය සංරක්ෂණ වන්දිය මගින් සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් ප්‍රතිමූල්‍ය අයිරා ණය අඩු කළ බව ලිඛිතව ලද පසු පහත පරිදි ගණුදෙනු සාරාංශ පොතේ සටහන් තැබිය යුතුවේ.

සමෘද්ධි බැංකුවට ගෙවිය යුතු අරුණළු ප්‍රතිමූල්‍ය අයිරා ණය පිටුව (වගකීම්) - I තීරුව

සාමාජිකයන්ගෙන් ලැබිය යුතු අරුණළු සහන ණය පිටුව (වත්කම්) - II තීරුව

3.17 ඉහත 3.16 පරිදි සටහන් තබන විටම "අරුණළු සහන ණය පොතේ" හා " සාමාජික ණය කාඩ්පතේ" අයවූ ණයක් ලෙස සටහන් තැබිය යුතුවේ.

**4 පොදු කරුණු**

4.1 අවුරුදු 25කට අධික කාලයක් සමෘද්ධි සහනාධාරලාභීන් හා අඩු ආදායම්ලාභීන් විසින් ඉතිරි කරන ලද මුදල් මත සමෘද්ධි බැංකුව තුළ ගොඩනැගුණු අරමුදල් පදනම් කරගෙන මෙම " අරුණළු සහන ණය වැඩසටහන" සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කරනු ලබන්නේ ග්‍රාමීය ජනතාව වර්තමානයේ මුහුණ දී සිටින " ක්ෂුද්‍ර ණය" ( Micro Credit) අර්බුදයට විසඳුමක් ලෙස බැවින් එය අරුමුණු ගත කරුණු සඳහා පමණක් භාවිතා කිරීමට සියළු ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් අවධාරණය කරගත යුතුවේ.

4.2 මෙම අරුණළු සහන ණය වැඩසටහනට අනුව තොරතුරු සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය විසින් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එම තොරතුරු ලබා දීමට සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ප්‍රජා නියකයින් වගකීමට බැඳී සිටින බව අවධාරණය කරගත යුතුවේ.

4.3 මෙම අරුණළු සහන ණය වැඩසටහනට අදාළව අවශ්‍ය වන මුද්‍රිත ලිපිද්‍රව්‍ය සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන මට්ටමින් මුද්‍රණය කර සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වෙත අලෙවි කර බෙදා හැරීමට අවසර ලබා දෙන අතර වෙනත් පාර්ශවයන්ට ව්‍යාපාරික චේතනාවෙන් මුද්‍රණ කටයුතු සිදු කර ලිපිද්‍රව්‍ය බෙදා හැරීමට අවසර ලබා දෙනු නොලැබේ.

4.4 මෙම චක්‍රලේඛ එකතුවේ සදහන් කරුණු හැර, සමෘද්ධි චක්‍රලේඛ අංක " ප්‍රජාමූල /11/2020/02" හි සදහන් අනෙකුත් කරුණු වෙනස් නොවේ.

4.5 මෙම චක්‍රලේඛයේ සදහන් කරුණු සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනිමක් අවශ්‍ය වන්නේ නම් ප්‍රජාමූල සංවිධාන අංශය භාර අධ්‍යක්ෂ ඇමතිමට කාරුණික වන්න.
(දුරකථන අංක - 011 2879773/ 071 4118226, ෆැක්ස් - 011 2873794)

ආර්.පි.බි. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. | ලේකම් - මුදල් අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 02. | ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 03. | අධ්‍යක්ෂ - ක්ෂුද්‍ර මූල්‍ය | - අ.ක.ස. |
| 04. | ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 05. | සියළුම අංශ ප්‍රධානින් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |